# MANRECAP මාසික පුවත් නිවේදනය #13

මැයි 2006 සිට අගොස්තු 2006 | # 13

## 1 : ශාන්තිපුරම් වල තල් ආශ්‍රිත ගෘහභාණ්ඩ නිෂ්පාදනය ඇරඹීම

ශාන්තිපුරම්වල කාන්තාවන් 7 දෙනෙකු තල් ආශ්‍රිත ගෘහභාණ්ඩ නිෂ්පාදන පුහුණු වැඩ සටහනට සම්බන්ධ වී පුහුණුව ලැබූ නිසා ඔවුහු දැන් ඒ භාණ්ඩ නිෂ්පාදනය කිරීමත් අලෙවි කිරීමත් ආරම්භ කොට ඇත. ඔවුහු ඒ භාණ්ඩ තල් සංවර්ධන මණ්ඩලයටත් එමෙන්ම පෞද්ගලික සාප්පුවලටත් අලෙවිකොට ඇත. මේ අනුව එක අයෙකුට ලැබෙන දළ ලාභය රුපියල් 440/= යේ සිට රුපියල් 3600 ක් දක්වා යයි ගණනය කොට ඇත.



තල් ආශ්‍රිත ගෘහභාණ්ඩ නිපදවන කාන්තාවන් ඒවා අලෙවිකරන ආකාරය

## 2 : පුත්තුකමාම් ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමය

පුත්තුකම්මාම් ප්‍රදේශයේ ජල සම්පාදන යෝජනාක්‍රමය පසුගිය මුදල් වර්ෂයේ අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ වෙන් කර තිබුණ මුදල් වලින් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කෙරුණු අතර මෙවර තවත් වැඩිපුර ජල නල සහ ජල කරාම සවිකරන ලදී. සමය්‍යපුරම් ප්‍රදේශයේ ජනතා ආධාර මුදල් වලින් තවත් වැඩිපුර නල මාර්ගයක් ජල සම්පාදන ක්‍රමයට එක් කරන ලදී.

තෙන්නවාඩි මුරුදන් කුලවේහි වැඩ තවමත් කෙරීගෙන යන අතර ඉන් වැඩ බොහොමයක්ම අවසන් අදියරේ පවතී.



පුත්තුකමාම්වල ප්‍රජා ජල සම්පාදන ක්‍රමය



පෞද්ගලික නිවෙසකට ජල නල පද්ධතිය ප්‍රජා දයකත්වය යටතේ සම්බන්ධ කර ඇති අයුරු.

## 3 : සෙවා ගම

### 3.1 කුකුල් පාලනය

ආහාර නිරීක්ෂණ වාර්තාව පදනම් කරගෙන ගොවි සංවිධාන සමග පැවැත්වූ සාකච්ඡාවෙන් අනාවරණය වූයේ ප්‍රදේශයේ ජනතාවගේ දැන් ගන්නා කෑම වේල පෝෂණ ගුණය වැඩි කළ යුතු බවය. ඒ නිසා සෑම ගමකම සත්ව පාලන කටයුතු වලින් ප්‍රමුඛත්වය කුකුල් පාලනය සඳහා දෙන ලදී. මේ අනුව සේවා ගම්මානයේ සිටින පවුල් 19 ක්



වෙනුවෙන් එක් පවුලකට කුකුල් පැටවුන් දහදෙනා බැගින් බෙ දෙනු ලදී. මේ සඳහා සේවා ගම තෝරාගත්තේ එහි ජීවන තත්වය අනෙක් ප්‍රදේශවලට වඩා සාපේක්ෂ වශයෙන් බොහොම පහත් තත්වයක් තිබු නිසාය.

දැන් මෙතනදී විශේෂයෙන් ම සඳහන් කළ යුතු වන්නේ මේ කුකුල් පැටව් වර්ග බෙ දෙන විට දේශීය වර්ගම දීමට හේතුව ඒ ඉලක්ක ගම්මාන වල පරිසරයට ඔවුන් හුරුවී ඇති නිසාත් එහෙයින් බෝ කිරීම පහසු නිසාත්ය. මේ වැඩ සටහන හඳුන්වා දීම හේතුවෙන් ප්‍රදේශයේ ජනතාවගේ ආහාර වේලෙහි පෝෂණික පදාර්තවල වර්ධනයක් ඇතිවේ යැයි බලාපොරොත්තු විය. විශේෂයෙන් ම බිත්තර ආහාර වේලට එක් වීමෙන් කාන්තා ගෘහ මුලික පවුල් වලට බාල පරපුරට පෝෂණ තත්වයේ වෙනසක් බලාපොරොත්තු විය හැකිය. එමෙන්ම වැඩිපුර ලැබෙන බිත්තර අලෙවි කර ගැනීමෙන් ඔවුන්ගේ අායම් තත්වය දියුණු කර ගැනීමට ද අවස්ථාවක්ද සැලසේ.

ඡායාරූපය : සේවාගමේ පවුලකට කුකුල් පැටවුන් බෙදීම

### 3.2 ප්‍රජා ජල සම්පාදන ක්‍රමය



සේවා ගමට පසුගිය මුදල් වර්ෂයේ අමාත්‍යාශ අරමුදල යටතේ නිම වුණු ජල සම්පාදන යෝජනා ක්‍රමයට අමතරව ජල නල හා ජල කරාම සවිකරන ලදී. මේ ජල සම්පාදන ක්‍රමයේ ඉදිකිරීමේ කටයුතු නිමවීමෙන් පසුව එක් ජල ටැංකියකින් පවුල් හතරක් පරිභෝජනයකට ගනු ලැබේ.

ඡායාරූපය : සේවා ගමෙහි ප්‍රජා ජල සම්පාදන ක්‍රමය.

### 3.3 පොල් පැල බෙ හැරීම

මේ ව්‍යාපෘතියට අිල ඉලක්ක ගම්මාන අතර පොල් වගා කටයුතු ගැන දැඩි උනන්දුවක් ඇති නිසා ගම් වාසීන් අතර පොල් වගාව ගැන විශාල ඉල්ලීමක් තිබේ. පසුගිය මුදල් වර්ෂය තුල දි පොල් සංවර්ධන මණ්ඩලයේ සහයෝගය ඇතිව මුලික හැඳින්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. මේ අනුව සේවා ගම්මානයේ පවුල් 30ක් අතර පොල් පැල 150 ක් ගෙවතු වගාව සඳහා බෙ දී ඇත.

## 4 : ගනේෂපුරම්

### 4.1 නැවත පදිංචි කිරීම සඳහා කැලෑ ප්‍රදේශ එළි පෙහෙළි කිරීම

ගනේෂපුරම් වල නිල වශයෙන් ඉඩම් බෙ වෙන් කර දීම සඳහා අවශ්‍ය ඉඩම් එළි කිරීමේ කටයුතු කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියට පවරා දී ඇති අතර එහි වැඩ කටයුතු අමාත්‍යාංශ අරමුදල් වලින් කෙරී ගෙන යයි.

### 4.2 වෙල්ලන්කුලම් ප්‍රදේශයේ වෙලද පොල ඉදිකිරීම

ගනේෂ්පුරම් සහ පලිආරු කාන්තා ග්‍රාම සංවර්ධන සමිති මගින් මේ වෙළඳපොල ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කොට කර ගෙන ගියද ආරක්ෂක තත්වය නරක අතට හැරීමත් සමගම මෙහි වැඩ ඇනහිට ඇති තත්වයක පවතී. මේ තත්වයට විශේෂයෙන්ම හේතුවූයේ අනාරක්ෂිත ප්‍රදේශවලට ඇතුලුවීමේ සහ පිටවීමේ මුරකපොලු වැසී යෑම නිසායි.

## 5 : පලිආරු

### 5.1 පලිආරු ප්‍රදේශයේ පොල් පැල බෙ හැරීම

පොල් සංවර්ධන මණ්ඩලයේ වගා ණය ක්‍රමය යටතේ පොල් පැල 665 ක් පලිආරු ප්‍රදේශයේ පවුල් පහක් අතර බෙ දී ඇත.



### 5.2 කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය කිරීම



පලිආරු ප්‍රදේශයේ තරුණ පිරිසක් හා කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියේ සාමාජිකාවකුත් එකතු වී කොන්ක්‍රීට් බිලොක්ගල් නිෂ්පාදන කටයුතු පලමු අවුරුද්දේ සිටම ආරම්භ කරන ලදී. මෙයට ව්‍යාපෘතියෙන් අතමාරුවට දුන් සිමෙන්ති බිලොක් ගල් නිපදවන යන්ත්‍රය ද ප්‍රයෝජනයට ගැනු ලැබීය. මෙසේ නිෂ්පාදනය කරනු ලබන අඩු මිල ගොඩනැගිලි ද්‍රව්‍ය මේ ප්‍රදේශයේ මෙන්ම පිට ප්‍රදේශ වල ජනතාවට ද අලෙවි කරන ලදී.

කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියෙ සහ අනෙකුත් ප්‍රජා සාමාජිකයින්ගේ ආරම්භක උනන්දුවක් ව්‍යාපෘතියේ සහයෝගය නිසාත් 2006 අප්‍රියෙල් මාසය දක්වා මේ වැඩ කටයුතු වලින් කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියට ලොකු ලාභයක් ලැබුණි. නමුත් අනාරක්ෂිත ප්‍රදේශ වලට සිමෙන්ති ප්‍රවාහනය තහනම් කිරීමෙන් පසු මේ වැඩ කටයුතු අඩපන විය. ඒ වගේම ගොඩනැගිලි ඉදි කිරීමේ සහ නිවාස ව්‍යාපෘති සියල්ලම නතර කර දැමීම නිසා සිමෙන්ති බිලොක් ගල් සඳහා වූ ඉල්ලුම ද නැතිවිය.

## 6 : සීතු විනයාගර් කුලම්

### 6.1 පාර පුනරුත්තාපනය කිරීම

2006 අප්‍රියෙල් මාසයේ දී අට්ටිමෝඩෙයි - කුරෙයි. සීතුවිනයාගර්කුලම් යා කෙරෙන කිලෝමීටර් 10.65 ක් වූ මාර්ගයේ අන්තිම කිලෝ මීටර් දෙකේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන ලදුව අගෝස්තු මස අවසාන වන විට පාර සමතලා කොට පස් තද කොට නිම කිරීමට හැකි වුවද පාර නිසියාකාරව සම්පූර්ණ කිරීමට අවශ්‍ය රෝලර් යන්ත්‍ර ග්‍රේඩර් යන්ත්‍ර නොමැති වීම නිසා එය සම්පූර්ණයෙන් ම නිම කිරීමට නොහැකි වී ඇත.

පින්තූරය : ප්‍රදේශයේ ප්‍රජාව මාර්ග කටයුතු වලට සහභාගීවන ආකාරය



## 6.2 ගුරු නිවාස ඉදිකිරීම

කුරෙයි පාසැලේ ගුරු නිවාසය තැනීමේ වැඩ කටයුතු 2006 අප්‍රියෙල් මාසයේදී කුරෙයි සහ සීතුවිනයාගර් කුලම් ප්‍රදේශවාසීන් විසින් ආරම්භ කරන ලදී. මුල් අවදියේදී වැඩ කොටස ඉතාම සතුටුයක අන්දමින් කෙරීගෙන ගියත් ප්‍රදේශයේ ආරක්ෂක තත්වය පිරිහීමක් සමගම වැඩ කටයුතු අඩාල විය. විශේෂයෙන්ම අනාරක්ෂිත ප්‍රදේශයට ඇතුල්වීමේ සහ පිටවීමේ රෙටු වසා දැමීම මෙයට හේතුවිය.



ගොඩනැගිලි තැනීම සඳහා සිමෙන්ති බ්ලොක් තැනීම



දැනට තනවාගෙන යන ගුරු නිවාස.

## 6.3 නැවත පදිංචිය සඳහා කැලෑ එළි කිරීම

සීතුවිනයාගර් කුලම් ප්‍රදේශයේ නිල වශයෙන් ඉඩම් බෙදීම පහසු කිරීම සඳහා අමාත්‍යාංශ ආධාර මුදල් යටතේ එහි ක්‍රම සංවර්ධන සමිතියේ කැලෑ එළිකිරීම කර ගෙන යයි.



## 7 : කුරෙයි

### 7.1 ජනතා ජල සම්පාදන ක්‍රමයක් ස්ථාපිත කිරීම

මේ ව්‍යාපෘතිය යටතේ පසුගිය මුදල් වර්ෂය තුළදී අමාත්‍යාංශ අරමුදල් වලින් සකස් කෙරුණු ජල සම්පාදන ක්‍රමයට වැඩිපුර ජල නල සහ ජල කරාම සවිකිරීම කොට ඒ වැඩ නිම කර ඇත.



ඡායාරූපය : ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ප්‍රජාව විසින් ගොඩනැගීම!

### 7.2 මිරිදිය මසුන් ඇතිකිරීම

2006 වර්ෂයේ පෙබරවාරි මාසායේදී කුඩා මිරිදිය මසුන් දහ්‌ හක් කුරෙයි වැවට මු හරින ලදී. අගොස්තු මාසයේ දී වැඩුණු මසුන් කිලෝ 859 ක් අල්ලා ගනු ලදුව. කුරෙයි ධීවර කාර්මිකයින් ගේ සමුපාකාර සමිතිය රුපියල් 15000 ක අියමකින් ලබාගන්නා ලදී. ඒ මුදල් යොදවා කුඩා මසුන් මිලයට ගෙන දෙවන වටයට අස්වනු නෙලා ගැනීම සඳහා වැවට නිදහස් කරන ලදී. කරවල නිෂ්පාදනය සඳහා පුහුණු වීමේ කටයුතු ආරක්ෂිත ප්‍රදේශවලට ඇතුලු වීදිකුම් සහ පිටවීමේ මුරකපොලු වැඩි යෑම නිසා කර ගෙන යෑමට නොහැකි විය.



ඡායාරූපය : කුරෙයි වැවේ ප්‍රාදේශීය ප්‍රජාව මසුන් ඇල්ලීමේ කටයුතු වල නිරත වෙයි.